

## යටි අරමුණ

### ලියා දන්වන වග යි

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ වත්මන්, ආණ්ඩුව තම දේශපාලන ගමන් මගේ තීරණාත්මක කඩඉමක් පසු කරන්නට සැරසෙන මේ මොහොතේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය අරබයා ලංකාව තුළත් ඉන් බැහැරව ජීවත්වන ශ්‍රී ලාංකිකයන් තුළත් ඇත්තේ විවිධ විග්‍රහයන් වුවද, ඒ සියළු විග්‍රහයන් තුල දැකිය හැකි පොදු ලක්ෂණයක් තිබේ. ඒ ආණ්ඩුව සම්බන්ධයෙන් කාරණාවන් අනාගනිමින් සිටින බවයි. ආණ්ඩුව සම්බන්ධයෙන් මතුවී ඇති මේ තත්වය අසත්‍යයක් නොවන වග ජනාධිපතිවරයා ගේ සිට පහලම මට්ටමේ මන්ත්‍රීවරයා දක්වා වූ සමස්ථ ආණ්ඩුවේ බහුවිධ ක්‍රියාකාරකම් ඔප්පුකර පෙන්වයි.

යුධ ජයග්‍රහණය පෙරටුකොට ගෙන ජනාධිපතිවරයා දෙවන වරටද සිය බලය තහවුරු කරගත්තද සමාජ ප්‍රශ්න විසඳීම අපේක්ෂා කරන ජනතාව වෙනුවෙන් ප්‍රමාණාත්මක ප්‍රතිඵල පෙන්වීමට ඔහු අපොහොසත් වෙමින් සිටින බව වඩ වඩාත් තහවුරු වෙමින් පවතී.

සිය පස්වසරක පාලන කාලය තුල යුධ ජයග්‍රහනය හැර වෙනත් ප්‍රතිඵලදායක වැඩ පිළිවෙලක් රටට ලබා දීමට ඔහු අසමත් වී තිබේ. යුද්ධය ජය ගත්තද ආර්ථික වශයෙන් රට පත් වී ඇති බියකරු අර්බුදයෙන් මුදවා ගැනීමට, විරැකියා-වට, හා සමස්ථ සමාජයේ සෑම ස්ථරයක් කෙරෙහි බලපාන ප්‍රධාන ප්‍රශ්න සඳහා ප්‍රමාණාත්මක වියදම් ලබා දීමට රජයට ඇති නොහැකියාව ගැන දැන් ජනතාව වේගයෙන් අවබෝධ කර ගනිමින් සිටිති.

ඒ අනුව රජපක්ෂ ආණ්ඩුවට ඉදිරියේ බලය පවත්වාගැනීමේ අරගලයක නිරත වන්නට සිදුවනේය යන්න සත්‍ය කාරනාවකි. මේ මොහොත වන විට ආණ්ඩුව පැරදවීමට තරම් ශක්තිමත් ප්‍රගතිශීලී බලවේගයක් සමාජය තුල තහවුරු වී නොමැති බැවින් එය ක්‍රියාත්මක වුවද ඉදිරියේ ඇති අවදානම කල් තියා දකින ආණ්ඩුවේ ඊනියා උපදේශකයෝ ඒ සඳහා උපාය මාර්ග සකසමින් සිටිති. ව්‍යවස්ථා සංශෝධන හරහා රටේ ප්‍රජාතන්ත්‍රවාදී ගමන් මග අහුරමින් සදාකාලික බලයක් අරබයා පෙරසූදානම් වීමේ සැබෑ යටි අරමුණ එයයි.

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .

# මේ කොයි යන්නේ.....?

මේ වන විට ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කිරිම ට යන 18 වැනි සංශෝධනය ගැන යෝජනාව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබ ශ්‍රේෂ්ඨාධිකරණය ට යොමු කරනු ලදු ව ජනමත විමසුමකින් තොර ව පාර්ලිමේන්තුවේ 2/3 අනුමැතියෙන් සම්මත කරගැනිමේ නිත්‍යානුකූලභාවය තහවුරු කොට පාර්ලිමේන්තුව ට ඉදිරිපත් කිරිම ට සූදානම් ව තිබේ. මේ මස 8-9 දිනවල දි මෙය සාකච්ඡාව ට බදුන් කොට සම්මත කර ගැනීම ආණ්ඩුවේ සැලසුම වි තිබේ.

මෙම සංශෝධන යෝජනාව මගින් අපේක්ෂා කරන්නේ මොනවාද ? කැබිනට් පත්‍රිකාව අනුව ඒවා මෙසේ වනු ඇත.

(1) එක ම පුද්ගලයකු ට ජනාධිපති ධූරය සදහා පත් විම ගැන පනවා තිබූ දෙවතාවේ සීමාව සහිත 31(2) ඉවත් කෙරේ.
(2) ජනාධිපතිවරයා මාස තුනක ට වරක් පාර්ලිමේන්තුව ට සහභාගි විමේ අවශ්‍යතාවය නිතිගත කෙරේ.
(3) 17වන සංශෝධනය මගින් පිහිටුවන ලද 'ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව' අගමැති, කතානායක, විපක්ෂනායක හා ඔවුන් නියෝජනය කරන ජාතින් ට අයත් නොවන, අගමැති හා විපක්ෂ නායක විසින් පත් කරනු ලබන තව දෙදෙනෙකු දක්වා සංයුතියෙන් අඩු කෙරෙන අතර සියළුම කොමිෂන් සභා සහ අනෙකුත් නිලයන් පත් කිරිමේ බලය ජනාධිපතිවරයා සතු වේරෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසිම පමණක් ප්‍රමාණවත් වේ.
(4) පොලිසිය ද ඇතුළත් රාජ්‍ය සේවය සම්බන්ධ සියළුම බලතල අමාත්‍ය මණ්ඩලය සතු වේ.

*__පවතින ව්‍යවස්ථාව විසින් මේ ප්‍රශ්න විසදන්න ට අසමත් විම නිසා ඇත්ත වශයෙන් ම අලුත් ව්‍යවස්ථාවක් අප ට අවශ්‍ය ව තිබේ. අවම වශයෙන් අන්තර්කාලින පියවරක් ලෙස ව්‍යවස්ථා සංශෝධනයක්වත් අවශ්‍ය ව තිබේ. එහෙත් යෝජිත 18 වැනි සංශෝධනය ඒ අසලින්වත් යන බවක් නොපෙනේ.__*

මෙම සංශෝධනයන් ජනතා පරමාධිපත්‍යය සහ රටේ ස්ථාවරත්වය තහවුරු කිරිම සදහා ගෙනෙනු ලබන බව ආණ්ඩුව සහ ඊට පක්ෂපාතී බලවේගවල තර්කය වි තිබේ.

ජනතාව එහෙමත් නැත්නම් ජනමතය යන්න තේරුම් කරගන්නේ කෙසේද? සාමාන්‍යකරණය කරන ලද ජනතාවගේ අදහස් 'ජනමතය' ලෙස සළකන බව පිලි ගත් පොදු නිර්වචනයකින් කියවේ. මෙසේ 'සාමාන්‍යකරණය' යනුවෙන් හදුන්වනු ලබන ක්‍රියාවලියේ දි අංක ගණිත ක්‍රමයක් අනුව ගණන් හදා බලා බහුතරය දක්වන අදහස 'මහජන මතය' ලෙස ගෙන හැර පෑම නිවැරදි ක්‍රමයක් ලෙස කිසිසේත් ම සැලකිය නොහැක. මන්ද යත් එවැන්නක් මගින් සුලුතරය ලෙස එක් ජනකොටසක් බැහැර කෙරෙන බැවිනි. එවිට ඒ අය විසින් පිළි නොගන්නා සම්මුතියක් ඒ අය මත ක්‍රියාත්මක කරන්නට වන බැවිනි.

එවැන්නක් පිඩනයටත්, නොසන්සුන්භාවයටත් හේතු වේ. අවසා-නයේ එය ප්‍රචණ්ඩ ගැටුම් දක්වා ම වර්ධනය විය හැක. ලංකාවෙ අපි, මේ තත්වය අත්දැක්කෙමු. අත්දකිමින් සිටින්නෙමු.

2009 මැයි 18 වන විට මිලිටරිමය වශයෙන් පාගා පොඩි කරන ලද ලාංකිය දමිළ ජනයාගේ අරගලය මෙවැනි බැහැර කිරිමක අසාර්ථකබව පෙන්නුම් කරන ප්‍රබල නිදසුනකි. මෙසේ පොඩි කර දැම්මෙන් පසුත් ඒ විසින් මතු කරන ලද ප්‍රශ්නය අවසන් නැති බව දනිමු. පවතින ලංකා රාජ්‍යය එහි වසන සියළුම ජනකොටස් හි සම්මුතියක ප්‍රකාශනයක් බව ට පත් කර ගැනිම කළ යුතු ව තිබුණි. එසේ නොහැකිනම් මිලගට ඇති ශිලාචාර විසදුම වනුයේ පවතින රාජ්‍යය ට එහි පුරවැසි සාමාජිකයන් ලෙස සමාන ගරුත්වයකින් යුතුව ඇතුළත් කර ගැනිම ට නොහැකි ජනකොටස් සදහා තමන්ගේ සම්මුතින් ක්‍රියාත්මක කළ හැකි



වෙනම ම රාජ්‍යයන් පිහිටුවා ගැනිම ට ඇති අයිතිය පිළිගැනිම ය. ස්වයංනිර්ණ අයිතිය යනු මෙයයි. එවැනි ප්‍රජාතන්ත්‍රවාදි සම්මුතියක් ඇති කරගනු වෙනුවට අප ගමන් කර ඇත්තේ ම්ලේච්ඡත්වයේ සහ අශිෂ්ඨත්වයේ ධජය කිසි හිරිකිතයකින් තොර ව ඉහළින් ම ඔසවා ගත් ගමන් මගක ය "විසදුම් විරහිත" අර්බුද උග්‍ර කරවන ගමන් මගක ය.

පවතින ව්‍යවස්ථාව විසින් මේ ප්‍රශ්න විසදන්න ට අසමත් විම නිසා ඇත්ත වශයෙන් ම අලුත් ව්‍යවස්ථාවක් අප ට අවශ්‍ය ව තිබේ. අවම වශයෙන් අන්තර්කාලින පියවරක් ලෙස ව්‍යවස්ථා සංශෝධනයක්වත් අවශ්‍ය ව තිබේ. එහෙත් යෝජිත 18 වැනි සංශෝධනය ඒ අසලින්වත් යන බවක් නොපෙනේ.

මෙම සංශෝධනය ට පක්ෂ ව අදහස් දක්වන්නන් (හෝ එසේ පෙනි සිටිම ට 'දෛවයෙන්' බල කෙරී ඇත්තන්) කියන පරිදි ඒ මගින් ජනතා පරමාධිපත්‍යය සුරැකෙන්නේ අපූර්ව ක්‍රමයකට ය. දැන ට දෙවරක් බලය ට පත් වු ජනාධිපතිට ම 'ජනතාව' ආයෙමත් කැමතිනම් ජනාධිපති පුටුවේ තවත් අවුරුදු දුසිම් බාගයක ට වාඩි කර විම ට ජනතාව ට 'අවස්ථාවක්' දිමෙනි ෟ මෙය ජනතා පරමාධිපත්‍යය පිළිබද පවතින ව්‍යවස්ථාවේ පවා දක්වා ඇති පුළුල් අර්ථය 'පැස්බර ශෛලියෙන්' යට ගැසිමකි.

'රටේ ස්ථාවරත්වය' ද කදිම ලෙස තොරොම්බල් කර දමන, එහි අර්ථය ට විරුද්ධව ම නිතර දෙවේලේ භාවිතා වන අලංකාර පදයකි ( රටක් ස්ථාවර වන්නේ ඒ රට වසන ජනතාව සහ ඒ

38 වන පිටට


**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**සේයා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායි-න් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318